# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.04.25 පැය 1530 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/836/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**සමාජ මාධ්‍ය හරහා පිරිමි ළමුන්ගේ අසභ්‍ය දශර්න ලබාගෙන වීඩියෝ දශර්න නිෂ්පාදනය කරන ලද සැකකරුවෙකු අත්අඩංගුවට - ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය.**

පිරිමි ළමුන් සම්බන්ධව අසභ්‍ය දශර්න සමාජ මාධය ජාලා හරහා ලබා ගනිමින් සහ ශ්‍රී ලාංකීක පිරිමි ළමයෙකුගේ අසභ්‍ය දශර්න නිෂ්පාදිනය කරන ලද සැකකරුවෙකු සම්බන්ධව අතුරුදහන් වූ සහ සූරා කෑමට ලක් වූ ළමුන් සඳහා වන ඇමරිකා රජයේ ජාතික මධ්‍යස්ථානය මගින් (NCMEC ) යොමු කර ඇති වාර්තාවක් අනුව ළමා හා කාන්තා අපයෝජනය නිවාරන කාර්යාංශය මගින් විමශර්න ආරම්භ කර ඇත.

ඒ අනුව, 2025.04.20 වන දින ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ආණමඩුව ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන ආඩිගම, ආණමඩුව ප්‍රදේශයේ පදිංචි ජංගම දූරකථන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යන පුද්ගලයෙකි.**

මෙම සැකකරු 2022 වශර්යේ සිට අන්තර්ජාලය ඔස්සේ විදේශීය ළමුන්ගේ ලිංගික ක්‍රියාකාරකම් අඩංගු අසභ්‍ය වීඩියෝ දශර්න හා ඡායාරූප එක් රැස් කරගනිමින් ඒවා නරඹා ඇති බවත් එසේම ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 13 ළමයෙකුගේ නිරුවත් වීඩියෝ සහ අදාළ ඡායාරූප නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් කරුණු අනාවරණය කර ගෙන ඇත.

වැඩිදුර විමශර්න ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමශර්න කාර්යාංශය විසින් සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**